INTERNATIONAL BACCALAUREATE
BACCALAURÉAT INTERNATIONAL
BACHILLERATO INTERNACIONAL

M01/149/S(2)

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Friday 18 May 2001 (morning)
Vendredi 18 mai 2001 (matin)
Viernes 18 de mayo de 2001 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

## INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question. You must base your answer on at least two of the Part 3 works you have studied. Substantial references to a Part 2 work of the same genre are permissible but only in addition to the minimum of two Part 3 works. References to other works are permissible but must not form the main body of your answer.

## INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- Ne pas ouvrir cette épreuve avant d'y être autorisé.
- Traiter un sujet de composition. La composition doit être basée sur au moins deux des œuvres étudiées dans la troisième partie du cours. La composition peut comporter des références importantes à une œuvre du même genre étudiée dans la seconde partie, mais uniquement en plus des deux œuvres de la troisième partie. Les références à d'autres œuvres sont permises mais ne doivent pas constituer l'essentiel de la réponse.

## INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta debe basarse en al menos dos de las obras estudiadas para la Parte 3. Se podrán hacer referencias importantes a una obra de la Parte 2 del mismo género pero solamente como complemento a las dos obras de la Parte 3. Se permiten referencias a otras obras siempre que no formen la parte principal de la respuesta.

පහත සඳහන් මාතෘකා අතුරින් <u>එකක්</u> යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතු ය. 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියකින් වුව ද පිළිතුරට කරුණු ලබා ගත හැකි ය. එහෙත් ඒ 3 වන කොටසින් ඇසුරු කෙරෙන අවම සංඛ්‍යාව වූ කෘති දෙකට අමතර වශයෙන් පමණි. පිටස්තර වෙනත් කෘති ගැනත් සඳහන් කිරීමට අවසර ඇතත් එය ඔබගේ පිළිතුරේ ප්‍රධාන අංශය නොවිය යුතුය.

<u>සම්භාව්‍ය සාහිත්‍යය</u>

1. <u>එක්කෝ</u>

(අ) "සම්භාව්‍ය සාහිත්‍යය හැම විට ම පාහේ උපදේශය ගැබ්ව පවතී." ඔබ හදාරා ඇති ග්‍රන්ථ දෙකක මේ ලක්ෂණය අන්තර්ගත වී ඇති ආකාරය සංසන්දනාත්මකව විමසන්න.

<u>නැතහොත්</u>

(ආ) "සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථවල නිරූපිත චරිත පහසුවෙන් ම 'සුදන' හෝ 'දුදන' වශයෙන් වර්ග කළ හැකි වේ. ඔබ කියවා ඇති සම්භාව්‍ය කෘතිවල චරිත නිරූපණය සම්බන්ධයෙන් මේ අදහස සත්‍යයක් ද යන්න සංසන්දනාත්මක ව පිරික්සන්න.

<u>නාට්‍ය කලාව</u>

2. <u>එක්කෝ</u>

(අ) ඔබ හදාරා ඇති නාට්‍ය ග්‍රන්ථ අතුරින් දෙකක ප්‍රධාන තේමාවන් හඳුනාගෙන ඒවා ප්‍රකාශ කිරීමට යොදා ඇති උපක්‍රමයන්ගේ ප්‍රතිඵල සංසන්දනාත්මකව පරීක්ෂා කරන්න.

<u>නැතහොත්</u>

(ආ) ප්‍රබල මානුෂික හැඟීම් ඉපදවීම සඳහා නාට්‍යයේ දී භාවිත වන රචනෝපක්‍රම කවරේද යන්න ඔබ හදාරා ඇති කෘති ඇසුරින් පිරික්සන්න.

<u>නවකථාව</u>

3. <u>එක්කෝ</u>

(අ) "කොතැනක සිටියත් මිනිසා මිනිසා ම බව ඒත්තු ගැනීමට නවකථාව අපට ආධාර වේ." ඔබ හදාරා ඇති නවකථා ඇසුරු කරමින් මේ අදහස සාකච්ඡා කරන්න.

<u>නැතහොත්</u>

(ආ) හොඳ නවකථාවක ශක්තිය රඳා පවතින්නේ අනුකම්පා සහගත දෘෂ්ටියකින් යුතුව මනුෂ්‍ය සම්බන්ධතා විවරණය කිරීම මතය. මෙම අදහසට එකඟ විය හැකිද?.

කාව්‍යය

4. එක්කෝ

(අ) කවියට විශේෂ වූ භාෂාවක් තිබිය යුතුය යන අදහසට එකඟ විය හැකි ද? ඔබ හදාරා ඇති කාව්‍ය ග්‍රන්ථවලින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න .

නැතහොත්

(ආ) ඔබ හදාරා ඇති කාව්‍ය ග්‍රන්ථ අතුරින් කවීන් දෙදෙනෙකුගේ නිර්මාණ තෝරාගෙන, ප්‍රබල ලෙස හැඟීම් දැනවීම සඳහා ඔවුන් භාවිත කරන රචනෝපක්‍රම සංසන්දනාත්මකව පරීක්ෂා කරන්න.

කෙටිකථාව

5. එක්කෝ

(අ) හොඳ කෙටිකථාවක පැහැදිලි තර්කානුකුල සිද්ධි පරම්පරාවක් තිබීම අත්‍යවශ්‍ය ලක්ෂණයක් නොවේ. ඔබ හදාරා ඇති කෙටිකථා ග්‍රන්ථ ඇසුරින් මේ කියමන විමසන්න.

නැතහොත්

(ආ) කෙටිකථාව යනු හුදෙක් දිගින් කුඩා වූ සිත් ගන්නා සුලු කතාවක් පමණක් නොවේ. ඔබ හදාරා ඇති කෙටිකථා ග්‍රන්ථ දෙකක් සසඳමින් මේ මතය පරීක්ෂා කරන්න.

පොදු ප්‍රශ්න

6. එක්කෝ

(අ) "සාහිත්‍ය නිර්මාණ අතුරින් වඩාත් ප්‍රබල ලෙස හැඟීම් දැනවීමෙහිලා සමත් වනුයේ ඛේදාන්තය යි." ඔබ හදාරා ඇති සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් මේ කියමන පිරික්සන්න.

නැතහොත්

(ආ) "මනුෂ්‍යයා සමාජ තත්වයෙන් උසස් වන තරමට පුද්ගලයන් අතර සම්බන්ධතා වඩාත් දුෂ්කර වේ." ඔබ හදාරා ඇති කෘති දෙකක් තෝරාගෙන මෙම කියමන සංසන්දනාත්මකව පරීක්ෂා කරන්න.

නැතහොත්

(ඇ) ස්ත්‍රී-පුරුෂ ප්‍රේමය සාහිත්‍යයෙහි සැමදා ඉතා ජනප්‍රිය වූ තේමාවක් වුවද, නවතම නිර්මාණ ඉපදවීමෙහිලා එය සතු ශක්‍යතාව අසීමිත බව පෙනේ. ඔබ හදාරා ඇති කෘති දෙකක් මේ කියමන ඇසුරින් සන්සන්දනාත්මකව විමසන්න.

නැතහොත්

(ඈ) සාහිත්‍යයේ පරමාර්ථය හුදෙක් පාඨකයා පිනවීම පමණක් නොවෙතැයි කියනු ලැබේ. ඔබේ අදහස අනුව සාහිත්‍යයේ වෙනත් පරමාර්ථ විය හැක්කේ මොනවා ද? ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘති දෙකක් ඇසුරින් පරීක්ෂා කරන්න. එම පරමාර්ථ ඉටු කර ගැනීමට කවර උපක්‍රම යොදා තිබේ ද යන්න විමසන්න.